ප්‍රවෘත්ති නිවේදනය - 2011 සැප්තැම්බර් 05

## එක්සත් ජනතා නිදහස් සන්ධාන කොළඹ පුරපති අපේක්ෂක මිලින්ද මොරගොඩ මහතා සිය ප්‍රතිපත්ති කතිකාව එළිදක්වයි

එක්සත් ජනතා නිදහස් සන්ධාන කොළඹ පුරපති අපේක්ෂක මිලින්ද මොරගොඩ මහතා අද පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවකදී සිය ප්‍රතිපත්ති කතිකාව එළිදැක්වීය. ''කොළඹ පරමාදර්ශී නගරයක් කරමු'' මැයෙන් හැඳින්වෙන එය හෙට නාරාහේන්පිට අභයාරාමයේදී පැවැත්වෙන උත්සවයකින් ආරම්භකොට සියළු ආගමික නායකයින් හා මහජනතාවට මොරගොඩ මහතා පිළිගැන්වීමට නියමිතය.

පාලනය ජනතා සහභාගිත්වයෙන් සහ ජනතාව එක්කරගනිමින් කළයුතුය යන මතය මත පිහිටන මොරගොඩ මහතා බලාපොරොත්තුවනුයේ සිය ප්‍රතිපත්ති කතිකාව කොළඹ පුරවැසියන් සමග එක්ව සම්පූර්ණ කිරීමටය. සිය ප්‍රතිපත්ති කතිකාව 'වෙනස්වීමට ඉඩ සහිත' නොනිමි ලියැවිල්ලක් සේ හඳුන්වන ඔහු පවසන්නේ මෙය මූලාරම්භය පමණක් බවයි. සිය ප්‍රතිපත්ති කතිකාව, ක්‍රියාත්මක කෙරෙන සැලසුමක් ලෙස නිමාවට පත්කිරීම සඳහා මොරගොඩ මහතා කොළඹ පුරවැසි ජනතාවගේ අදහස් ලබාගැනීමට බලාපොරොත්තු වේ. කොළඹ වෙසෙන සියළු ජනකොටස් සමග ඉදිරි සති කිහිපය තුළ සිදුකෙරෙන නිරන්තර සංවාද තුළින් ජනතා අදහස් ලබාගනු ඇත. මේ සඳහා විවිධ පෙරමුණු භාවිතාකරනු ඇති අතර කුඩා කණ්ඩායම් සාකච්ඡා, දුරකතන සමීක්ෂණ සහ විවිධ සමාජ මාධ්‍ය වේදිකා ඔස්සේ කෙරෙන අදහස් හුවමාරුකරගැනීම් වැනි සාම්ප්‍රදායික ප්‍රවේශ මෙන්ම 'ට්විටර්' සහ 'ෆේස් බුක්' වැනි නවීන සංනිවේදන මාධ්‍යයන් යොදාගැනීමට ද කටයුතු යොදා තිබේ. මොරගොඩ මහතා වැඩිදුරටත් පැවසුවේ ජනතා අදහස් ද අන්තර්ගත කළ අවසාන ප්‍රතිපත්ති ප්‍රකාශනය මැතිවරණයට පෙර නිකුත් කිරීමට කටයුතු යොදා ඇති බවයි.

ප්‍රතිපත්ති කතිකාව හඳුන්වාදෙමින් මොරගොඩ මහතා පවසන්නේ ''හොඳින් ක්‍රියාත්මකවන සහ පාලනයවන මෙන්ම සියළු ජාතීන්ට අයත් පුරවැසියන්ට සාමයෙන් සහ සතුටින් එක්ව ජීවත්විය හැකිවූ ද ගෞරවණීය ලෙස ජීවිකාව කළහැකිවූ ද නගරයක් බවට පත්කිරීම සඳහා අවශ්‍ය දක්ෂ සහ වෘත්තීයමය පරිපාලනයකින් කොළඹ සන්නද්ධකිරීමට'' ඔහු බලාපොරොත්තුවන බවයි. කොළඹ 'අනෙකුත් නගරවලට ආදර්ශයක් වියහැකි' 'පරමාදර්ශී නගරයක් බවට පත්කරන' බව මොරගොඩ මහතා එහි තවදුරටත් පවසයි. කොළඹ පුරවැසියන්ගේ ජීවිතවල ගුණාත්මකභාවය වැඩිදියුණුකිරීමට තමන් තුළ හැකියාව ඇති බවට විශ්වාසය පළකරන ඔහු සහභාගීත්වයෙන් කෙරෙන පාලනක් අනුගමනය කරන බව සඳහන් කරයි.

දැනට කොළඹ සිදුකෙරෙමින් පවතින සංවර්ධන කටයුතු පිළිබඳව සඳහන් කරන කතිකාව ''එම වැදගත් සංවර්ධන කටයුතු නිසියාකාරව සිදුකරන්නට නම් අදාල විවිධ රජයේ ආයතන සහ වැඩසටහන් මනාව සම්බන්ධීකරණය කිරීම මෙන්ම ඒ සඳහා අවශ්‍ය සම්පත් රජයේ විවිධ අංශවලින්, පෞද්ගලික අංශයෙන් මෙන්ම ජාත්‍යන්තර සම්පත් සපයන්නන්ගෙන් ද ලබාගැනීමේ හැකියාව තිබිය යුතුය''යි ද අවධාරණය කරයි.

දැන් ත්‍රස්තවාදී තර්ජනවලින් නිදහස්වී තිබෙන කොළඹ නගරයේ සංවර්ධනය වඩා වේගවත්කිරීම පිණිස අවශ්‍ය සම්පත් නොයෙක් මාර්ග හරහා රැස්කිරීමේ හැකියාව තමන් තුළ පවතින බව ප්‍රතිපත්ති කතිකාව තවදුරටත් සඳහන් කරයි. කොළඹ නගරයේ උපරිම වටිනාකම ලබාගතහැකි පරිද්දෙන් සංවර්ධනය කිරීම සඳහා රජයේ සියළු ආයතන සමග සහයෝගයෙන් කටයුතුකිරීමට මොරගොඩ මහතා බලාපොරොත්තු වන බව ද කතිකාවේ සඳහන්වේ. ''පටු දේශපාලනයෙන් ඔබ්බට' ගොස් 'තම නගරය මුල් තැන තබා හැකියාවන් සහ සමාජයට කැපවීමක් ඇති නායකයින් තෝරාගැනීමට කටයුතු කරන ලෙස' මොරගොඩ මහතා මෙහිදී ඉල්ලා සිටී.

ඇමතිවරයකු වශයෙන් සිටියදී ඔහු යටතේ ඇරඹුනු ''e ශ්‍රී ලංකා'' වැඩසටහන අපට සිහිගන්වමින් මොරගොඩ මහතා පවසන්නේ ''පුරවැසියන්ගේ පහසුව සලසනුවස් කොළඹ නගරසභාවේ පරිපාලන

ක්‍රියාදාමයන් නවීකරණය කෙරෙනු ඇත යනුවෙනි. මෙහිදී පැවසෙන්නේ ''පුරවැසියන් සමග මුහුණට මුහුණලා කෙරෙන රාජකාරි නගරසභාවේ කලාප කාර්යාල හය වෙත ගෙන යනු ලැබේ. අනෙකුත් රාජකාරි ද නගර ශාලාවෙන් පිටත නගරසභා සේවකයන්ගේ පදිංචියට ආසන්න ස්ථානවලට ගෙනයනු ඇත. මේ සියල්ල පුළුල් සහ නවීන සංනිවේදන ජාලයක් මගින් සම්බන්ධ කෙරේ'' යනුවෙනි.

යළි පදිංචි කරන කොළඹ වැසියන් කිසිවකු 'කොළඹ සීමාවෙන් පිටත' පදිංචි නොකරන බව කතිකාවෙහි අවධාරණය කරන මොරගොඩ මහතා ඉදිරි තෙවසර තුළ වාසයට අයෝග්‍ය නිවාසවල පදිංචිව සිටින්නන් සඳහා නව නිවාස 35,000 ක් ඉදිකිරීම රජයේ අරමුණ බව පවසමින් එසේ යළි පදිංචිකරවන්නන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කොළඹ නගරසභාව පෙනී සිටින බවට සහතික වෙයි.

දැනටමත් අරමුදල් ලැබී ඇති නිතර සිදුවන ජලගැලීම් පාලනය සඳහාවන සුවිශාල ව්‍යාපෘතිය තුළ කොළඹ නගරසභාව විසින් ඉටුකිරීමට නියමිත කාර්යභාරය පිළිබඳව ද මොරගොඩ මහතා මෙහිදී විස්තර කරයි. කොළඹ නගරයේ වාහන තදබදය සම්බන්ධයෙන් කතිකාවෙහි දැක්වෙන සටහනින් පදිකයින්ට, විශේෂයෙන්ම මහළු සහ ආබාධිතවූවන්ට පහසුවෙන් ගමන් කළහැකි නිතර නඩත්තු කෙරෙන සමතල පදිකවේදිකා සහ රියදුරන් විසින් ගරුකරනු ලබන පදිකමාරු ඇතිකිරීමට සපථ කරයි. එමෙන්ම සරල ගාස්තුවලින් යුත්, වෙන්කල මංතීරුවල ගමන්කරන කවාකාර බස් සේවා ඇතිකිරීමට කොළඹ නගරසභාව කටයුතු කරන බව ද මොරගොඩ ප්‍රතිපත්ති කතිකාවෙහි සඳහන්ය.

වයස අවුරුදු 18-28 අතර තරුණ කණ්ඩායම් පිළිබඳව සාකච්ඡාකරන මොරගොඩ මහතා ඔවුන්ට ජීවන මාර්ග සලසාගැනීමට සහායවන පුළුල් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට පොරොන්දු වෙයි. කුඩා ව්‍යාපාර ඇරඹීම සඳහා සහ රැකියාවක් ලබාගැනීමට අවශ්‍ය නිපුණතා සංවර්ධනය සඳහා මූල්‍ය සහ තාක්ෂණික ආධාර මේ වැඩසටහනට අයත්ය. වැඩසටහන ක්‍රියාත්මක කෙරනුයේ එම වයස් කණ්ඩායම්වලට අයත් කිසිවකු නිකරුනේ හෝ රැකියා විරහිතව කාලය ගතකරනු වැළැක්වීමේ අරමුණිනි. ඒ හැරුණුවිට තරුණයින්ට රැකියා ලබාදීමේ මාර්ගයක් වශයෙන් පෞද්ගලික අංශයේ ද ආධාර ඇතිව රැකියා පොල සංවිධානය කෙරෙනු ඇත. මෙහි පළමුවැන්න පුරපති ධුරයට පත්වී පළමු දින 100 ඇතුලත පැවැත්වීමට මිලින්ද මොරගොඩ මහතා පොරොන්දු වෙයි.

නිවාස ක්ෂේත්‍රයේ සැලසුම්වලට, විවිධ ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ආදර්ශ ව්‍යාපෘති ඇතුලත්ය. වාසයට නුසුදුසු නිවාසවල පදිංචිව සිටින්නන් සඳහා තට්ටුනිවාස ඉදිකිරීමට කොළඹ මහ නගරසභාව නාගරික සංවර්ධන අධිකාරිය සමග එක්ව ආදර්ශ තට්ටුනිවාස ඉදිකොට පවුල් සංඛ්‍යාවක් ඒවායේ පදිංචි කරනු ලබනුයේ ඒවායෙන් උගන්නා පාඩම් යළි පදිංචිකිරීම සඳහා උපයෝගී කරගනු පිණිසය. මේ ආකාරයෙන්ම ව්‍යායාම් මධ්‍යස්ථාන සහිත ආදර්ශ ප්‍රජා කේන්ද්‍ර සහ ආදර්ශ නගරසභා වෛද්‍ය මධ්‍යස්ථාන ද සංවර්ධනය කරන බව ප්‍රතිපත්ති කතිකාව සඳහන් කරයි. මේවා තුලින් උගන්නා පාඩම් අන්තර්ගත කරමින් කොළඹ ජනජීවිතය උසස්කිරීම පිණිස විශාල පරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරෙනු ඇත.

යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍ය ඩලස් අලහප්පෙරුම සහ 'මිලින්ද පුරපති කරමු' ව්‍යාපාරයේ ප්‍රතිපත්ති සම්පාදක කණ්ඩායමේ ප්‍රධානි මහාචාර්ය රොහාන් සමරජීව යන මහත්වරු ද මෙම ප්‍රවෘත්ති සාකච්ඡාවේදී අදහස් දැක්වූහ.

සංවාදයට එක්වන්න.
දුරකතනය: 011 4020635; කාර්යාලය: 8/30 සිද්ධාර්ථ පාර, කොළඹ 6
Email: email@milinda.org URL: www.ourcmb.com Twitter: @milindamoragoda